තේ තතු
පර්යේෂණ සංවත්සරය 80 විසරක අභිමතය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement
THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA 1925
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි
ISSN - 1391- 6785

සැවැන්දරා (*Vetiveria zizanioides*) වගාකර පස සුරකිමු

පාංශු ඛාදනය වළක්වා පස සශ්‍රීක කිරීම තේ වගාවේදී අවධානය යොමු කල යුතු සුවිශේෂ ම කටයුත්තක් බව නොරහසකි. පාංශු ඛාදනය අවම කිරීමේදී සමෝච්ච කාණු, නෙත්ති කාණු හෝ ගල් වැටි වලින් සිදුවන කාර්යභාරය ඉමහත් ය. මේවාට අමතර ව ශාක වැටි වගා කර පස සංරක්ෂණය කර සශ්‍රීක කිරීමද කල හැකිය. මේ සඳහා විවිධ ශාක වර්ග යොදා ගත හැකි අතර සැවැන්දරා තෘණ (වැටිවර්) යොදා ගැනීම ඉතාමත් යෝග්‍ය වේ. පාංශු ඛාදනය වැලැක්වීමේ කර්තව්‍යය ඉටු කරන තෘණ වර්ග අතරින් සැවැන්දරා ප්‍රමුඛස්ථානයට පත්වීමට හේතු සාධක වන සුවිශේෂ ලක්ෂණ මොනවා දැ යි අපි මදක් විමසා බලමු.

මුහුදු මට්ටමේ සිට මීටර් 2000 ක පමණ උසක් දක්වා හොඳින් වැඩෙන, මි.මී 200 සිට මි.මී. 5000 පමණ වන අධික වර්ෂාපතන ඇති තත්ව යටතේ දී ත් සෙල්සියස් අංශක -9 සිට 45 වැනි ඉහල උෂ්ණත්ව පරාසයක් තුලදීත් හොඳින් ඝනව පඳුරු ලා වැඩෙන මෙය ඝර්ම කලාපීය තෘණ වර්ගයකි. ඝණව ගැඹුරට වැඩෙන තන්තු මුල් පද්ධතියකින් යුත් මෙය සෙ.මී. 30 පමණ විෂ්කම්භයකින් යුත් පඳුරක් ලෙස වැඩෙන අතර සාමාන්‍යයෙන් සෙ.මී.100 පමණ උසට වැඩෙයි. පත්‍ර සෙ.මී. 75 පමණ දිගට සෘජුව ඉහලට වැඩෙන අතර පත්‍රයක් මි.මී.8 පමණ පළලය.

මීට අමතරව සැවැන්දරා තෘණ පහත සඳහන් සුවිශේෂ ලක්ෂණ වලින් අනූනය.

- මෙය බහු වාර්ෂික තෘණ වර්ගයක් නිසා පාලන කටයුතු පහසු වීම .
- වගා කල විට ඉතාමත් ඉක්මනින් ඝණව වැඩුනු ස්ථිර තෘණ වැටියක් බවට පත්වීමට ඇති හැකියාව,
- ගැඹුරට වැඩෙන තන්තු මුල් පද්ධතිය පස හොඳින් බැඳ තබන තෘණ වැටියක් බවට පත්වීම,
- මතුපිටින් ගලා යන ජලයේ ඇති ඛණිජ පෝෂක

සහ අනෙකුත් පළිබෝධනාශක අවශේෂ ආදිය අවශෝෂණ කර ගැනීමට මෙහි මුල් වලට ඇති හැකියාව නිසා ජල දූෂණය අවම කිරීමේ හැකියාවක්ද ඇතැයි විශ්වාස කෙරේ.

- මෙහි පුෂ්ප වදය. ඊට අමතරව මේවායේ ඉගත රෙසෝම ආදිය නොසැදෙන නිසා අනවශ්‍ය ලෙස වල් පැලයක් ලෙස පැතිරීම සිදු නොවේ.
- මෙහි තියුණු පත්‍ර දාරය සහ වාෂ්පශීලී ද්‍රව්‍ය අඩංගු මුල් පද්ධතිය මගින් මීයන්, සර්පයන් හා වෙනත් එවැනි සතුන් පලවා හරියි. මෙය ගවයන්ටද යෝග්‍ය ආහාරයක් නොවන නිසා ගවයන්ගෙන් මෙම තෘණ වැටි වලට හානි සිදු නොවේ.
- නියං තත්වයන්ට, ගංවතුරට හෝ ජලය රඳා පැවතීමේ තත්වයන්ට හොඳින් මුහුණ දෙයි.
- අවට ඇති බෝග සමඟ තරඟ නොකරයි.
- මෙහි වැඩීම පසේ සශ්‍රීක බව, පී.එච් අගය, පාංශු ව්‍යුහය හෝ වයනය එසේත් නැති නම් ඇලුමිනියම් විෂ බව ආදි කරුණු මත රඳා නොපැවතීම නිසා ඕනෑම ප්‍රදේශයක පහසුවෙන් වගා කල හැකි ය.
- හොඳින් වැඩුනු සැවැන්දරා වැටියකින් සැවැන්දරා නොමැති අවස්ථාවකට වඩා 3-5 ගුණයකින් පමණ වැඩියෙන් පස සුරකින බව පෙනී ගොස් ඇති අතර, සාමාන්‍යයෙන් වැඩි වර්ෂාපතනයක් ඇති ප්‍රදේශයක 5% පමණ බෑවුම් ඇති භූමියක දී සැවැන්දරා වැටියක් මගින් වසරකට සෙ.මී.10 ක පමණ උසට පස් හෝ රොන් මඩ එක් රැස්වන බව පෙනී ගොස් ඇත.
- සැවැන්දරා වැටි නිතර කපා දැමුවත් නොමැරී නැවත හොඳින් වර්ධනය වේ.
- මෙම තෘණ වැටි වලින් කපා දමන කොල වසුනක් ලෙස යොදා ගැනීමෙන් පස සරු කිරීමට හැකි අතර පත්‍ර වල වියලි බරින් 1.29% නයිට්‍රජන්ද, 0.15% සල්ෆර් ද 0.20%, පොස්පරස් ද 1.3% පොටෑසියම් පෝෂකද අඩංගු බව සොයා ගෙන ඇත.
- තේ වගාවට හානිකරන වටපනු ගහනය අඩුකිරීමේහැකියාවක් ඇත.

තේ ඉඩම් වල මෙම වාසි සියල්ල ලබා කර ගැනීම සඳහා සමෝච්ච වැටි ලෙස හෝ සමෝච්ච කාණු වල ඉහල ගැට්ට දිගට සෙ.මී. 10-15 පරතර ඇතිව සැවැන්දරා වවා ඒවා නිරතුරුව සෙ.මී. 30-50 පමණ උසින් කපා ඉඩමට දැමිය යුතුය.

බී. ඒ. ඩී. සමන්සිරි